CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# පාර්ලිමේන්තුව විසුරුවාහරිමින් සහ මැතිවරණයන් කැඳවමින් ජනාධිපතිවරයා සිදු කළ විශේෂ ප්‍රකාශනය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2018 නොවැම්බර් 12 වැනි දා, කොළඹ, ශ්‍රී ලංකාව :*** ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඔක්තෝබර් 26 වැනි දින සිට පෙර නොවූ විරූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයක් ජනනය කරමින් දිගින් දිගටම සහ හේතු විරහිත ලෙස සිදු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනතුරට පත් කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තැතිගැන්මට පත්ව සිටී. මෙයින් වඩාත්ම මෑත කාලීන සිදුවීම වුයේ නොවැම්බර් 09 වැනි දා ජනාධිපති සිරිසේන මහතා විසින් විශේෂ ප්‍රකාශනයක් නිකුත් කරමින් (අති විශේෂ ගැසට් පත්‍ර 2096/70) අටවන පාර්ලිමේන්තුව විසුරුවා හැර 2019 ජනවාරි 05 වැනි දින මහා මැතිවරණයක් සඳහා දින නියම කිරීමක් සිදු කිරීමට උත්සාහ කිරීමයි.

මෙම පියවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන හා නෛතික බලය ඉක්මවුවක් වන බැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2018 නොවැම්බර් 12 වැනි දින මෙම පියවරට එරෙහිව තම ආයතනය හා එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා වෙනුවෙන් නඩු පැවැරීමක් සිදු කරන ලද්දේ ජනාධිපතිවරයාගේ එකී විශේෂ ප්‍රකාශනය අවලංගු කරන ලෙස ඉල්ලමිනි.

මෙහිදි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ස්ථාවරය ස්ථිර වුවක් වෙයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **70(1)** සහ **33 (2) (ඇ)** ව්‍යවස්ථා එක්ව කියවන විට අතිශයින්ම පැහැදිලි වන කරුණ නම් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසිරවීමට බලය ඇත්තේ එම පාර්ලිමේන්තුවේ පළමුවන රැස්වීම් වාරයේ සිට වසර හතරක් සහ මාස හයක් ගත වු විට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකක යෝජනා සම්මතයකින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ඉල්ලා සිටිනු ලැබූ විටෙක පමණක් වන බවයි. මෙම කරුණු දෙකෙන් එකක් හෝ සැපිරී නොමැති හෙයින් ජනාධිපතිවරයා විසින් කරනු ලැබු මෙම විශේෂ ප්‍රකාශනය අවලංගු වුවක් වෙයි.

2015 වසරෙහිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනම වන සංශෝධනය පනවනු ලැබුයේ ජනාධිපති සිරිසේන මහතා හා ඔහුගේ සංධානය විසින් දෙන ලද පොරොන්දුවට අනුව විධායකයේ බලතල පාලනය කරනු පිණිසය. ව්‍යවස්ථා 70 වන ව්‍යවස්ථාව එවැනි එක් ප්‍රතිපාදනයක් වු අතර එමගින් ඒකපාක්ෂික ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා සතුව තිබු බලතල ඉවත් කරනු ලැබිණි. දහනම වන සංශෝධනය පනවනු ලැබුයේ රාජ්‍යයේ එක් බාහුවක් විසින් තවත් බාහුවක් ක්‍රියාත්මක වීම බලහත්කාරයෙන් වැලැක්වීමට එරෙහිව සංවරණ, තුලන ක්‍රම සහ ආරක්ෂණෝපායයන් ප්‍රකෘතිමත් කිරීම සහ හඳුන්වා දීම පිණිසය. මෙය අපගේ ප්‍රජාතන්ත්‍රවාදයේ මුලික ලක්ෂණයක් වන අතර ජනාධිපති සිරිසේන මහතාගේ ක්‍රියාවන්ගෙන් නිරූපණය වන්නේ විධායකය විසින් පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරීත්වය මර්ධනය කිරීම පිණිස ගන්නා ලද අතිශය බරපතල උත්සාහයකි. නෛතික තත්ත්වය සහ දහනම වන

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

සංශෝධනය පදනම් වූ දේශපාලන ගමන්‍යතාවය සමග ගත් කළ ඔහුගේ වත්මන් ක්‍රියාකාරකම් නෛතිකව, දේශපාලනිකව සහ සදාචාරත්මක ලෙස වලංගු නොවූ ඒවාය යන කරුණ පිළිබඳව කිසිදු සැකයකට ඉඩක් නොමැති බව කිව යුතු වෙයි.

ජනාධිපති සිරිසේන මහතා  විසින් පත්කරනු ලැබූ රජයෙහි නිත්‍යානුකූල බව ඇතුලු ගැටළු රාශියක් තවමත් නොවිසඳී පවතී. මෙබඳු තත්ත්වයක් තුල දී ඔහු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි ඒකපාක්ෂික ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හැර මහා මැතිවරණයක් කැඳවීමට ක්‍රියාකල ආකාරය මගින් මෑත සතිවල පැවැති අස්ථාවරත්වය වැඩිදුරටත් උග්‍රකරවනු ලැබ තිබේ. කෙටි කාලීනව බැලූ විට එමගින් සියලු ලංකිකයන් අනවශ්‍ය ලෙස දැඩි අවිනිශ්චිතතාවයකට ලක් කරනු ලැබ ඇති අතර ඉහල නැංවෙන කලබලකාරී තත්ත්වය තුල ඔවුන් හට ඇති විය හැකි දේශපාලන ප්‍රචණ්ඩත්වයක අනතුරකට ද ලක් කරනු ලැබ තිබේ. පුළුල් ලෙස බැලූ විට එය ජනාධිපති සිරිසේන මහතා ඔහු තේරී පත් වීම උදෙසා ප්‍රකාශකොට සිටි හා ඒ අනුව තේරී පත් වූ ප්‍රජාතාන්ත්‍රික වගකිවයුතුභාවයේ මුලධර්මයන් ගර්භිත ලෙස උල්ලංඝණය කිරීමක් ය. මෙම කරුණු දෙකම උදෙසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සියලු ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටින්නේ මෙම අශෝභන සහ භයානක බලය අයුතු ලෙස  උපයෝගී කරගැනීමට එරෙහිව දැඩි ලෙස  පෙනී සිටින ලෙසය. එසේ කොට තමන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් දැඩි ලෙස ඉල්ලා සිටින ලෙස සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නගා සිටුවන ලෙස ද අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නෙමු.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org